## දැන්වීමයි

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024

**නියමිත ඡන්ද පොළකදී ඡන්දිය දීමට නොහැකි වීම පිළිබඳ සාධාරණ බියක් ඇතිවිට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය**

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127ආ වගන්තිය මගින් නියමිත ඡන්ද පොළේදී ස්වකීය ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට, වෙනත් යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට අවසර ඉල්ලා සිටිය හැකි බවත්, ඒ අනුව අදාළ අයට ඡන්දය දීම සඳහා වැඩ පිළිවෙලක් සැකසිය හැකි බවත්, මෙයින් දන්වනු ලැබේ.

පනතේ 127ආ.(1) උප වගන්තිය මෙසේය,

> **"වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොටගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, තමාගේ ඡන්දය, කොමසාරිස්වරයා* විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය."**
>
> (*මැතිවරණ කොමිෂන් සභාව)

එම ඡන්ද හිමියන්ට ස්වකීය ඉල්ලුම් පත්‍ර නාමයෝජනා දැන්වීමේ දින සිට දින 07ක් එනම් 2024.10.01 දිනට පෙර රාජගිරිය, සරණ මාවතේ පිහිටි, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට හෝ තමා පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට හෝ ඉදිරිපත් කළ හැකිය. ඉල්ලුම්කරුවන් විසින් 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන අදාළ විස්තර ඉල්ලුම් පත්වලට ඇතුළත් කළ යුතුය. මෙම නාමලේඛනයට අදාළ තොරතුරු සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/ කච්චේරිවල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබනු ඇත. තවද, 2024 ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන ලියාපදිංචි විස්තර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද පරීක්ෂා කළ හැකිය.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිවැරදි බවට සනාථ කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් නොමිලේ ලබාගත හැකි අතර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද බාගත කළ හැකිය.

මැතිවරණ කොමිෂන් සභාව

2024 සැප්තැම්බර් මස 25 දින

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත
රාජගිරිය

# නියමිත ඡන්ද පොළකදී ඡන්දිය දීමට නොහැකි වීම පිළිබඳ සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන් විසින් වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීමට මැතිවරණ කොමිෂන් සභාවෙන් අවසර ඉල්ලීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය

01. ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ කුමන ඡන්ද විමසීමකට අදාළව ද? - පාර්ලිමේන්තු මැතිවරණය 2024

02. (i) ඡන්ද හිමි නාමලේඛනයේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ සම්පූර්ණ නම -

.............................................................................................................................

(ii) ජාතික හඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(iii) පරිගණක ගත කිරීම සඳහා මුලකුරු සමග නම (ඉංග්‍රීසි භාෂාවෙන්)

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

03. (i) ඡන්ද හිමි නාමලේඛනයේ අයදුම්කරුගේ/ කාරියගේ නම ලියාපදිංචි වී ඇති ආකාරය

| මැතිවරණ කොට්ඨාස අංකය | මැතිවරණ කොට්ඨාසයේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ඡන්ද ප්‍රදේශය | ඡන්ද කොට්ඨාස අංකය | ලියාපදිංචි පිළිවෙල අංකය |
|---|---|---|---|---|---|
| | | | | | |

(ii) දැනට සාමාන්‍ය පදිංචි වී සිටින ස්ථානයට අදාළ විස්තර

| තැපැල් ලිපිනය | ලිපිනය අයත් | | | ලිපිනයේ පදිංචියට පැමිණි දිනය | | |
|---|---|---|---|---|---|---|
| | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පරිපාලන දිස්ත්‍රික්කය | වර්ෂය | මාසය | දිනය |
| | | | | | | |
| | | | | | | |

04. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වීමට හේතුව :-

.............................................................................................................................

05. ඉහත තොරතුරු නිවැරදි බවත්, මාගේ නියමිත ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වෙතැයි බියක් මා තුළ පවතින බවත් ප්‍රකාශ කරමි. එබැවින් මම දැනට පදිංචි ස්ථානයට ආසන්න ස්ථානයක පිහිටි ඡන්ද පොළේ දී ඉහත ඡන්ද විමසීමේ දී ඡන්දය දීමට අවසර දෙන මෙන් ඉල්ලමි.

දිනය : ............................ අයදුම්කරුගේ අත්සන : ...............................................

ඉල්ලුම්කරුගේ අංකය .............. (ග්‍රාම නිලධාරී විසින් සටහන් කළ යුතුය)

## ග්‍රාම නිලධාරී සහතිකය

(පහත දැක්වෙන විස්තර පැහැදිලි කරන්න/ ඉදිරිපත් කරන්න)

1) අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු නිවැරදිද? ....................................................

2) අදාළ අයගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිද? ....................................................

3) (i) අයදුම්කරුගේ ඉල්ලීම නිර්දේශ කරන්නේද? ඔව් / නැත

(ii) වෙනත් කරුණු ඇතොත් සඳහන් කරන්න ....................................................

....................................................................................................

දිනය : ............................................ අත්සන - ..............................................

ග්‍රාම නිලධාරී වසම - ................................

නිල මුද්‍රාව -

(මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා)

**FOR OFFICE USE**

| Current Registration | | Applicant's Name with Initials | Residency | |
|---|---|---|---|---|
| E.D. No. | | | E.D. No. | |
| Pol Div. | | | Pol Div. | |
| Pol Dist. No. | | | Pol Dist. No. | |
| Serial No. | | | | |